මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය - 2014

---

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138 - සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ සංවර්ධන ණය ගිවිසුම අනුව, එවකට මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කාර්යක්ෂම ජාතික මාර්ග පද්ධතියක තිරසාර බෙදාහැරීම මඟින් ප්‍රවාහන පිරිවැය අඩුකිරීමයි. සංවර්ධන ණය ගිවිසුම අනුව, ව්යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො මිලියන 100 කට හෝ රු.මිලියන 10,125 කට සමාන විගැහි 69,100,000 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද එ.ජ.ඩො මිලියන 98.1 කට හෝ රු.මිලියන 11,579 කට සමාන විගැහි 59,600,000 ක අතිරේක වෙන්කිරීමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2008 ජුනි 23 දින එළඹි අංක 4429 සීඊ දරන පළමු අතිරේක සංවර්ධන ණය ගිවිසුම යටතේ සපයා තිබුණි. තවද 2011 මාර්තු 15 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර අංක 4906 සීඊ දරන දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුමට එළඹි අතර එජඩො මිලියන 100 කට හෝ රු.මිලියන 11,081 කට සමාන විගැහි 63,600,000 ක අතිරේක වෙන්කිරීමක් ඒ සඳහා කර තිබුණි. ආරම්භකව, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර 2011 මාර්තු වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුමේ කරන ලද විධිවිධානයන් ප්‍රකාරව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපාතිය විසින් පවත්වා ගෙන යනු ලබන වර්ධනය කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් සංවර්ධන ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) සංවර්ධන ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) සංවර්ධන ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) සංවර්ධන ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

2010 වර්ෂයේ සිට රු.244,228,424 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග නඩත්තු භාර අරමුදලට භෞතිකව මාරුකර තිබුණද එම වත්කම්වල වටිනාකම අපහරණය කිරීම සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. තවද, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල රු.119,874,924 ක ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් ව්‍යාපෘතිය විසින් සිදුකර තිබුණද මාර්ග සංවර්ධන අධිකාරියට හා රේඛීය අමාත්‍යාංශයට භාර දෙන ලද වත්කම් සම්බන්ධයෙන් භෞතික පැවැත්ම පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි.

2.2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

---

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛය අනුව, ජාතික පුවත්පත්වල දැන්වීම් මඟින් ඉල්ලුම්පත් කැඳවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සිදු කළ යුතු අතර වර්ෂ තුනක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් පත් කළ යුතුය. කෙසේවුවද ඉහත විධිවිධානයන්ට පටහැනිව ව්‍යාපෘතියේ සමස්ත කාර්ය මණ්ඩලය මාර්ග සංවර්ධන අධිකාරියෙන් තාවකාලිකව මුදාහරින ලද නිලධාරින්ගෙන් සමන්විත විය. එකී චක්‍රලේඛයට අනුව, රජයට අයත් ආයතනවලට අනුයුක්ත කරන නිලධාරීන් රාජ්‍ය සේවයේ සේවා කාලය තුළදී උපරිම වර්ෂ 5 ක කාලයක් සඳහා පමණක් පූර්ණ කාලීන පදනම මත ව්‍යාපෘතිවලට මුදාහැරිය යුතුය. කෙසේවුවද මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදාහරින ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය අර්ධ කාලීන පදනම මත සේවයේ යෙදී තිබුණි.

(ආ) මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ නිලධාරියකු සහ මාර්ග සංවර්ධන අධිකාරියේ තවත් නිලධාරියකු ඇතුලුව නිලධාරින් 07 දෙනෙකු සඳහා විදේශීය පුහුණු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 16.17 ක මුදලක් වැය කර තිබුණද එම පුහුණු වැඩසටහන ව්‍යාපෘතියේ කාර්යයන්වලට ඍජුවම අදාළ නොවන බව සෝදිසි පරීක්ෂණයකදී අනාවරණය විය. තවද ජනාධිපති ලේකම්ගේ 2014 ජුලි 09 දිනැති අංක සීජ්/1/1/16/1 දරන චක්‍රලේඛයෙන් අවශ්‍ය පරිදි සහභාගී වූ නිලධාරින් විසින් දිවයිනට පැමිණීමෙන් පසු දින 7 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය
---------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
------------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සංවර්ධන ණයගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2014 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය | | | | | | |
| ණය අංක 4138 සීඊ | 100.0 | 10,125 | 1.12 | 145.8 | 75.3 | 9,787 |
| ණය අංක 4429 සීඊ | 98.1 | 11,579 | 1.0 | 137.2 | 83.9 | 10,912 |
| ණය අංක 4906 සීඊ | 100.0 | 11,081 | 25.87 | 3,363.3 | 61.2 | 7,960 |
| විනිමය වෙනස | - | - | 0.05 | 7.6 | 3.0 | 398 |
| ශ්‍රී ලංකා රජය | - | - | 0.4 | 64.0 | 52.0 | 6,771 |
| | 298.1 | 32,785 | 28.44 | 3,717.9 | 275.4 | 35,828 |

ව්‍යාපෘතිය විසින් විශේෂ (ඩොලර්) ගිණුම් 3 ක් එක් එක් ව්‍යාපෘති ගිවිසුම් යටතේ පවත්වා තිබුණු බවත්, 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩොලර් ගිණුම්වල රු.2,384,997,072 කට සමාන එ.ජ.ඩොලර් 18,199,332.71 ක ශේෂයන් පැවති බවත් නිරීක්ෂණය විය.

3.2 භෞතික ප්‍රගතිය
----------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ජාතික මාර්ග 4 ක සියලු පුනරුත්ථාපන වැඩ පිළිබඳ සියයට 90 කට වැඩි භෞතික ප්‍රගතියක් 2014 දෙසැම්බර් 31 දිනට වාර්තා කර තිබුණි. කෙසේ වුවද, එම ඉදිකිරීම් වැඩ සඳහා යෙදී සිටි කොන්ත්‍රාත්කරුවන් සඳහා මාස 02 කට වැඩි කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණි.

(ආ) ඊට අමතරව, කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගයේ පානදුර නගරයේ ගුවන් පාලම ඉදිකිරීම් වැඩ 2014 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට සියයට 84 භෞතික ප්‍රගතියක් පමණක් දක්වා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග 04 ක පුනරුත්ථාපන වැඩ පිළිබඳ පිරිවැය විචලනයන් එම වැඩවල ආරම්භක ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සියයට 12.6 සිට සියයට 18.3 දක්වා වැඩියෙන් එම වැඩ සම්පූර්ණයෙන් නිමකිරීමේ දිනයට පැවතුණු බව නිරීක්ෂණය විය. කෙසේවුවද මාර්ග වැඩ සම්පූර්ණයෙන් නිමකිරීමෙන් පසුව එකතුව රු.මිලියන 603.82 ක විචලනයන් අනුමත කර තිබුණු බව නිරීක්ෂණය විය. මහජනයා විසින් කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස මහජන උපයෝගිතා සඳහා වැඩිදියුණු කිරීම් හේතුවෙන් එම විචලනයන් පැන නැඟී ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂ පැහැදිලි කර තිබුණි. ඒ අනුව පසුව වන පිරිවැය විචලනයන් සිදු නොවීම සඳහා ආරම්භක අදියරයන්හිදී මාර්ග වැඩ හා ඒ සඳහා පිරිවැය පිළිබඳ විධිමත් සමීක්ෂණයන් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අනනුකූල වාර්තාව මත (Non – conformance Report) පැලියගොඩ - පුත්තලම මාර්ගයේ හා කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගයේ ස්ථාන කිහිපයක අපේක්ෂිත මට්ටමට නොවූ ඇස්පල්ට් බැඳීම් ස්ථරය (asphalt binding course) ඉවත් කිරීමට උපදේශකවරුන් උපදෙස් නිකුත් කර තිබූ බව විගණනයේදී අනාවරණය විය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුවන් විසින් අපේක්ෂිත මට්ටමට නොවූ ඇස්පල්ට් බැඳීම් ස්ථරය ඉවත් කිරීමෙන් තොරව ඇස්පල්ට් ආවරණ ස්ථරයක් (asphalt wearing course) අතුරා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2014 මාර්තු 12 දින විගණකවරුන් හා මාර්ග සංවර්ධන අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශයේ නිලධාරීන් එක්ව සිදුකරන ලද පරීක්ෂණයේදී මාර්ග සලකුණු කිරීම් කාර්යයන් සඳහා යොදාගෙන තිබූ තීන්ත මාර්ග සංවර්ධන අධිකාරියේ සම්මත පිරිවිතරයට අනුකූල නොවූ බව අනාවරණය විය. තවද, ඉහත සඳහන් මාර්ගයේ ස්ථාන 03 කින් ලබාගන්නා ලද ද්‍රව්‍ය මත සිදුකරන ලද තත්ත්ව පරීක්ෂණයට අනුව, භාවිතා කරන ලද අමුද්‍රව්‍යවල ගුණාත්මක තත්ත්වය අපේක්ෂිත මට්ටමට නොපැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගය හරහා පානදුර නගරයෙහි විදුලි පියගැටපෙළ (escalator) පහසුකම සමඟ ගුවන් පාලමක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් 2014 පෙබරවාරි 21 දින ප්‍රදානය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ ප්‍රවාහන පර්යේෂණ හා අධ්‍යයන මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලද 2010 ජනවාරි 15 දිනැති වාර්තාව අනුව පානදුර නගරයේ වාහන මෙහෙයවීම වැඩිදියුණු කිරීම සඳහා කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගය හරහා ගුවන්පාලමක් ඉදිකිරීම නිර්දේශ කර තිබුණි. කෙසේවුවද ශක්‍යතා අධ්‍යයනයක් හා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් ආදිය සිදු කිරීමෙන් තොරව ගුවන් පාලමට පියගැටපෙළ පහසුකමක් හඳුන්වා දී තිබුණි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කොන්දේසිවල 8.1 හා 8.2 වගන්තිවල අවශ්‍ය පරිදි පියගැටපෙළ පහසුකම හඳුන්වාදීම මඟින් වැඩ විෂය පථයෙහි විචලනයන්ට අදාළව සංශෝධිත විස්තරාත්මක වැඩ සැලැස්මක් කොන්ත්‍රාත්කරු විසින් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුමේ 4.9 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු තත්ත්ව සහතික සැලැස්ම කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියට ඉදිරිපත් කර නොතිබුණි. උපදේශක ගිවිසුම මඟින් පියගැටපෙළ පහසුකම සැපයීම පිළිබඳ වැඩ ඇතුළත් කර නොතිබූ බැවින් උපදේශක විසින් එය අධීක්ෂණය කර නොතිබුණි.

(ඉ) 2012 ජුලි සිට 2014 දෙසැම්බර් 31 දක්වා දේශිය උපදේශක ගාස්තු ලෙස රු.9,384,000 ක මුදලක් උපදේශකට ගෙවා තිබුණද, උපදේශක ගිවිසුමේ ඇතුළත් යොමුගත කොන්දේසි අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා උපදේශකගේ වැඩ පිළිබඳ මැදිහත්වීම තහවුරු කිරීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නිෂ්කාර්ය වත්කම්

----------------------

රු.84,001,283 කට ප්‍රසම්පාදනය කරන ලද නල එළීමේ අමුද්‍රව්‍ය, ව්‍යාපෘති පරිශ්‍රයේ වර්ෂ 02 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

3.5 පරිබාහිර කටයුතු

---------------------

මාර්ග සංවර්ධන අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශයේ ගබඩා නවීකරණය සඳහා හා මීගමුවේ මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාලයේ වයර් වැට හා මායිම් තාප්පය ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය විසින් වැය කරන ලද රු.මිලියන 2.05 ක මුදලක් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ඍජුවම අදාළ නොවන කාර්යයන් විය.

3.6 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු කළ අගය මත බදු ගණනය කිරීම සඳහා යොදාගන්නා ලද වෙනස් අනුපාතයන් හේතුවෙන් කරන ලද අතුරු ගෙවීම් මත එකතු කළ අගය මත බදු ලෙස රු.776,000 ක මුදලක් කොන්ත්‍රාත්කරුට අඩුවෙන් ගෙවා තිබුණි.

(ආ) පරිවයක් වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදාහරින ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ව්‍යාපෘතිය විසින් පාරිතෝෂික සඳහා ගෙවීම් වාරිකව ප්‍රේෂණය කර තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවා කාලපරිච්ඡේදය වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයද ඇතුළත්ව සම්පූර්ණ සේවා කාල පරිච්ඡේදය පදනම් කරගෙන පාරිතෝෂික ගණනය කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරින් 22 ක් සඳහා 2014 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 6.96 ක අතිරේක මුදලක් ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක මණ්ඩලය සඳහා රු.539,734 ක් වූ දිරිදීමනා හා රු.1,376,971 ක් වූ පොදු කාර්ය පිරිවැය 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 ඡේදවලට පටහැනිව ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

3.7 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

මෝටර් වාහන 09 ක් කුලියට ලබා ගැනීම සඳහා සේවා සැපයුම්කරුවන් සමඟ ව්‍යාපෘතිය විසින් ගිවිසුම්වලට එළඹ තිබුණු අතර රු.11,088,132 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබුණි. මාසයකට ධාවනය කළ යුතු අවම කිලෝමීටර සංඛ්‍යාව ආවරණය කර ගැනීම සඳහා එම වාහන ව්‍යාපෘතිය විසින් යොදා ගෙන නොතිබූ බවත් ඒ හේතුවෙන් ධාවනය සඳහා යොදාගෙන නොතිබූ කිලෝමීටර 48,418 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,039,534 ක් වැඩිපුර ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය.